02. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල , හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2014.10.21 දින අසන ලද ප්‍රශ්නය

(ප්‍ර/VI (1) /14/43)

අ. කළුතර ප්‍රාදේශීය සභාව මගින් සංවිධානය කල පොසොන් උදානය 2014 සඳහා පහන් කූඩු කුටි කොපමන ඉදිකලේද?

ආ. එම කුටි ඉදිකිරීමට පෞද්ගලික ආයතන වෙතින් ටෙන්ඩර් කැඳවනු ලැබුවේද? ඒ කුටි කීයක් සඳහාද?

ඇ. එම ටෙන්ඩරය ලබාගත් ආයතනය කුමක්ද? එම ආයතනය කුටි 40ක් සඳහා ඉදිරිපත්කල මිල ගණන කොපමනද?

ඈ. එම ආයතනය මගින් අඩි 15-15 කුටි කීයක් ඉදිකලේද? ඒ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමනද?

ඉ. එම ආයතනය මගින් අඩි 10-10 කුටි කීයක් ඉදිකලේද? ඒ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමනද?

03. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2014.10.21 දින අසන ලද ප්‍රශ්නය

(ප්‍ර/VI (1) /14/44)

අ. 2014 ජුනි 12-15 කාලය තුල කළුතර ප්‍රාදේශීය සභාව විසින් කළුතර නාගොඩ ගල්ලස්ස ප්‍රදේශයේදී පොසොන් කලාපයක් පැවැත්විද?

ආ. එම කලාපය සඳහා වැයකල මුළු මුදල කොපමනද? එයින් ප්‍රාදේශීය සභාව විසින් වැයකල මුදල කොපමනද?

ඇ. සභාව මගින් ඉදිකරන ලද තොරන. පොසොන් කලාපයේ ශබ්ද විකාශන යන්ත්‍ර, වේදිකාව ඉදිකිරීම, විදුලි අලෝක කරණය. පහන්කූඩු කුටි ඉදිකිරීම සඳහා අදාල ගෙවීම් සිදුකර ඇත්තේ කවර දිනයන්හිද? කවර ආයතනයන්වද? කවර චෙක්පත් අංක යටතේද?

ඈ. එම චෙක්පත් ප්‍රදේශීය සභාවෙන් භාරගෙන ඇත්තේ කවුරුන් විසින්ද? එම පුද්ගලයා දැනට ප්‍රාදේශීය සභාවේ දරන තනතුර කුමක්ද?

ඉ. මෙම එක් එක් අයිතමයන් සඳහා ගෙවීම් සිදුකිරීමට ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගත්තේ කවදාද?

ඊ. මෙම ගෙවීම්වලට අදාලව ප්‍රාදේශිය සභා සභාපතිවරයා විසින් මුදල් රෙගුලාසි හා සභාරීති උල්ලංඝනය කර තිබේද?

උ. එසේ තිබේනම් ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

04. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/VI (1) /14/46)

අ. කොළඹ අධ්‍යාපන කලාපයේ පළාත් සහා පාසල් ගණන කියද?

ආ. එම පාසල්වල 2,3,4 හා 5 ශ්‍රේණිවල අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කියද?

ඇ. එම පාසල් හා ශ්‍රේණි වලට අනුව කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ඈ. නොඑසේනම් ඒ මන්ද?

05. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/VI (1) /14/47)

අ. ගම්පහ අධ්‍යාපන කලාපයේ පළාත් සහා පාසල් ගණන කියද?

ආ. එම පාසල්වල 2,3,4 හා 5 ශ්‍රේනි වල අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කියද?

ඇ. පාසල් හා ශ්‍රේණි වලට අනුව කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ඈ. නොඑසේනම් ඒ මන්ද?

06. ගරු සු. ජෝර්ජ් පෙරේරා මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/VI (1) /14/48)

අ. බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙකුට හිමිවන පළාත් සභා ප්‍රතිපාදන වෙන් කළ හැකි ව්‍යාපාතින් / වෙන් නොකළ හැකි ව්‍යාපෘතින් වෙන වෙනම සඳහන් කළ හැකි ද? එසේ නම් එම ව්‍යාපෘතින් කවරේද?

ආ. පළාත් සභා අරමුදල් කුමන හේතුවක් නිසා හෝ තම පෞද්ගලික මනාපයට අනුව යෙදවීමට මන්ත්‍රීවරුන්ට බලය පවරා ඇත් ද?

ඇ. පළාත් සභා මන්ත්‍රීවරුන් තම සිතැඟි පරිදි පළාත් සභා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට ඔබතුමා වෙත පැමිණිලි ලැබී ඇත් ද?

ඈ. පැමිණිලි ලැබී ඇත්නම් ඒවා මෙම සභාවට ඉදිරිපත් කළ හැකි ද?

ඉ. පැමිණිලි ලැබී ඇත්නම් හෝ පැමිණිලි කළ පසුව ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද? යන්න වෙන් වෙන්ව මෙම සභාවට ඉදිරිපත් කළ හැකි ද?

ඊ. නොඑසේනම් ඒ මන්ද?

07. ගරු හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රකෂක සේවා, සහ සභා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /14/49)

අ. i ඛස්නාහිර පළාත් සභාවේ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම 2014/10/14 වන දින මීගමු දිස්ත්‍රික් රෝහලේ කරන ලද යෝදිසි වැඩ සටහනේදී එහි 'එකෝ' යන්ත්‍රය අක්‍රිය වී ඇති බවට හෙළිදරව් වූ අතර ඒ පිළිබඳව ඔබතුමා දන්නේද?

ii එය යථා තත්වයට පත්කිරීමට ගෙන ඇති පියවර කවරේද?

ආ. I රෝහලේ ඉදිකරන ලද නව-මහල් ගොඩනැගිල්ල ප්‍රමිතියෙන් තොරව ඉදි කර ඇති නිසා වැසි දිනවලදී නේවාසික රෝගීන් මෙන්ම කාර්ය මණ්ඩලයද, අපහසුතාවයකට පත්වන බව ඔබතුමා දන්නේද?

ii දිනකට 5000 ඉක්ම වූ ජනතාවක් පරිහරණය කරන මෙම ගොඩනැගිල්ලේ අනාරක්ෂිත බව පිළිබඳව සුදුසු පියවරක් ගන්නේද?

ඇ i. මෘත ශරීරාගාරයේ අධිශීතකරණය අක්‍රිය වී ඇති බව දන්නේද?

ii. එය යථා තත්වයට පත්කිරීමට ගෙන ඇති පියවර කවරේද?

ඈ. අක්‍රමවත් පල්දෝරු පද්ධතියේ අපද්‍රව්‍ය පිටතට ගලා යාමෙන් මීගමු කලපුවට සහ පරිසරයට සිදුවන හානිය සඳහා පිළියම් යොදන්නේද?

ඉ. තාවකාලිකව පවත්වා ගෙන යන ඖෂධ ගබඩාවේ ඇති බෙහෙත් වර්ග ගබඩා කිරීම සඳහා ප්‍රමිතියට අනුකූලවූ ගබඩාවක් ලබාදීමට කටයුතු කරන්නේද?

ඊ. රෝහල් කාර්ය මණ්ඩල ඌණතාවය නිසා රෝගීන්ට විධිමත් සේවාවක් නොසැපයෙන බැවින් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් කඩිනමින් ලබාදීමට කටයුතු කරන්නේද?

උ. නොඑසේනම් ඒ මන්ද?

08. ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදාහැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ, හා සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/50)

අ. කළුතර සී/ස මතුගම විවිධ සේවා සමුපකාර සමිතිය පිළිබඳව ඔබ තුමාටද පිටපතක් සහිතව 2014/07/02 දින දාතමින් සමුපකාර සංවර්ධන කොමසාරිස් මගින් සමුපකාර ප්‍රඥප්තියෙහි 46 (1) 47 (1) වගන්ති යටතේ ඉල්ලා ඇති විභාගය/ පරීක්ෂණය නොකරන්නේ මන්ද?

ආ. අංක: සමු/කා/සං/3/14/ හා 2012/05/23 සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ පරීක්ෂණයෙන් හෙළිවී ඇති රු: 28,81,316,26 ක මුදල අයකර ගැනීමට කටයුතු නොකරන්නේ මන්ද?

ඇ. ටෙන්ඩර් පටිපාටියෙන් තොරව සමිතියේ සභාපති/ උප සභාපති සමිතිය සතු වටිනා දේපල සිය ඥාතීන් හා හිතවතුන්ගේ නමින් ලබාගෙන බාහිර පුද්ගලයන්ට අතුරු බදු දීම පිළිබඳව පරීක්ෂණයක් නොකරන්නේ මන්ද?

ඈ. මතුගම සමුපකාර සමිතිය සතු ගල්මත්ත ඉඩමේ කළු ගල කඩා විකුණා රුපියල් ලක්ෂ 02 ක පමණ මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලය හා නිලධාරීන් වංචනිකව ලබාගෙන ඇති බව දන්නේද?

ඉ. කළුගල කැඩීමේදී ටයි බීම් රහිතව ඉදිකල සමිතිය සතු ගොඩනැගිල්ලකට සිදුවූ හානි පිළිබඳව පරීක්ෂණයක් නොකරන්නේ මන්ද?

ඊ. මෙවන් විවිධ දූෂිත ක්‍රියා වලට සම්බන්ධ සමුපකාර සමිතියේ පාලනය කොමසාරිස් යටතට පත් නොකරන්නේ මන්ද?

09. ගරු මංජු ශ්‍රී අරංගල – විපක්ෂනායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/51)

අ. හොරණ අධ්‍යාපන කලාපයේ ඔලබොඩුව සුමංගල මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා එම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇත්තේද? එම සුදුසුකම් සඳහන් කරන්නේද?

ආ. විදුහල්පතිවරයා සිය අත්තනෝමතික තීරණ මත පාසැලේ ගුරු භවතුන් ස්ථානමාරු කරමින් ජාතික ගුරු මාරු ප්‍රතිපත්ති, දෙපාර්තුමේන්තු චක්‍ර ලේඛන, ආයතන සංග්‍රහයේ විධි විධාන කඩකර ඇති බව පිළිගන්නේද?

ඇ. මොහුට හිතවත් අතිරික්ත ගුරුවරුන් 17 දෙනෙකු පාසැලේ රඳවා ගෙන ඇති බව දන්නේද?

ඈ. පාසැලේ මුදල් වියදම් කිරීමේදී සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳව පරීක්ෂණයක් කරන්නේද?

ඉ. තම විෂයන්ට අදාල ගුරුවරුන් වෙනත් විෂයන් ඉගැන්වීමට යෙදවීම, විදුහල්පතිවරයාට හිතවත් ගුරුවරුන් රාජකාරි වලින් නිදහස් කිරීම, ප්‍රාථමික අංශයේ ගුරුවරුන් ඉහල ශ්‍රේණිවල අධ්‍යාපන කටයුතු සඳහා යෙදවීම, ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් අධීක්ෂණය සඳහා නවක ගුරුවරුන් යෙදවීම, ආදි පාසැල් පරිපාලනයේ විවිධ අක්‍රමිකතා සිදුවන බව දන්නේද?

ඊ. ගුරු සංගමයක ලේකම් යැයි කියා ගන්නා මොහු, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පවා අභිබවායමින් ගුරුවරුන් විවිධ හිංසනයට ලක්කිරීම පිළිබඳව, සුදුසු පියවරක් ගන්නේද?

උ. අධ්‍යාපන ක්ෂේත්‍රය දේශපාලණීකරණය වීමෙන් ගුරුවරුන් විවිධ අපහසුතාවලට ලක්වීම මෙන්ම දරුවන්ගේ අධ්‍යාපනය අඩාල වීම පිළිබඳව සුදුසු පියවර ගන්නේද? නොඑසේනම් ඒ මන්ද?

10. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/52)

අ. අධ්‍යාපන කලාප මට්ටමින් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා විදුහල්පතිවරුන් ද සමග ශ්‍රී.ල.නි.ගුරු සංගමයේ නියෝජිතයින් ද කැඳවමින් ඔබතුමාගේ මූලිකත්වයෙන් පැවැත් වූ රැස්වීම් කුමන ස්වභාවයක ඒවාදැයි මෙම සභාවට ප්‍රකාශ කරන්නේද?

ආ. එකී රැස්වීම් වලදී ශ්‍රී.ල.නි ගුරු සංගමයේ ප්‍රවර්ධනයට අදාළව පාසල් තුළදී සාමාජික බඳවා ගැනීම් සිදුකරන ලෙසට බලපෑම් සිදුකර තිබීම සැබෑවක්ද?

ඇ. මේ ආකාරයට විදුහල්පතිවරුන් තම නිලය යොදා ගනිමින් ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයට සාමාජිකයින් ලෙස, පාසලේ ගුරුවරුන් බලහත්කාරයෙන් බඳවා ගැනීමට දරන උත්සාහයට ගුරුවරුන්ගේ දැඩි විරෝධයත්, පිළිකුලත්, ප්‍රකාශ වන බව ඔබ දන්නේද?

**11.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/53)

අ. i. අන්තර් පළාත් ස්ථාන මාරු යටතේ අප පළාතට ගුරුවරුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය කුමක්ද?

ii. වෙනත් පළාත් වලින් ස්ථාන මාරු නිර්දේශ ලැබ පැමිණෙන ගුරුවරුන් මෙම වර්ෂය තුළ (2014) මෙම පළාතට බඳවාගෙන තිබේද?

iii. එසේ බඳවාගෙන තිබේනම් ඒ කොපමණ සංඛ්‍යාවක්ද?

iv. එසේ බඳවාගත් ගුරුවරුන් බඳවාගත් පදනම කුමක්ද?

v. එසේ බඳවාගත් ගුරු වර්ග මොනවාද? කොපමණ සංඛ්‍යාව බැගින්ද?

ආ. I පළාත් පාසල් සේවයේ නියුතු ගුරුවරුන් ජාතික පාසල් සේවයට මුදා හරින්නේ කුමන ප්‍රතිපත්තියක් මත පිහිටාද?

ii මෙම වර්ෂය තුල පළාත් පාසල් සේවයෙන් ජාතික පාසල් සේවයට මුදාහල ගුරු සංඛ්‍යාවන් ඒ ඒ ගුරු වර්ගය අනුව කොපමණද?

iii ජාතික පාසල් සේවයට, පළාත් පාසල් සේවයේ නියුතු ගුරුවරුන් මුදාහරින ක්‍රමවේදය විනිවිදව හා ක්‍රමවත්ව ක්‍රියාත්මක කරන්නේද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා:

'ඔන් ලයින් ලොතරැයි ව්‍යාපාරය 2014 අප්‍රේල් මස මුල් සතියේ සිට ක්‍රියාත්මක වන අතර. එහි මූලස්ථානය කොළඹ 02. නවම් මාවතෙහි පිහිටා ඇත. තවද රට පුරා එවැනි මධ්‍යස්ථාන 3000 ක් ස්ථාපිත කිරීමට සූදානම් කර ඇත. මෙය ලොතරැයියක මුවාවෙන් වන සූදුවක් වන අතර, රටේ තරුණ පරපුර වේගයෙන් ඊට ඇබ්බැහි වෙමින් පවතී. එහි ඇති වඩාත් භයානකකම වන්නේ මේ තුල ලොටෝ සහ ජැක්පොට් යන ක්‍රීඩාවන්ද අන්තර්ගත වීම සහ නිවසේ සිටද මෙම ලොතරැයි සමග ක්‍රීයා කළ හැකි වීමයි. මෙවැනි උවදුරකින් බස්නාහිර පළාතේ ජනතාව මුදා ගැනීම මෙම පළාත් සභාවේ ප්‍රමුඛතම යුතුකම හා වගකීමද වන බැවින් මෙවැනි ව්‍යාපාර වලට ආධාර අනුබල නොදීමට සියළු වගකිව යුතු පුද්ගලයන් සහ ආයතන වගබලා ගත යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි'

(යෝ/VI (1) 14/06)

### 02. ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය;

'බස්නාහිර පළාත තුළ පිහිටි ඇතැම් අධිකරණ බල සීමා නැවත නිර්ණය කර, නව අධිකරණ කලාපවලට වෙන් කිරීමටත්,ඒ අනුව කාර්ය භාරයයන් පැවරීමටත්, රජය කටයුතු කර ඇතත් ,එහිදී නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම නිසා ජනතාවට විවිධ අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුව ඇතිවා මෙන්ම, විශාල මුදල් ප්‍රමාණයක් නාස්ති වීමක් ද සිදු වේ. ජනතාවට, පොලිස් නිලධාරින්ට මෙන්ම අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ට ඉතා සමිප අධිකරණයක් තිබියදී වාහන සඳහා ඉන්ධන වැය කරමින් දුරින් පිහිටි අධිකරණය සදහා ගමන් කිරීමට සිදුව ඇත.එබැවින් මෙම සියලු කරුණු නිසි අධීක්ෂණයකට යටත් කොට, නිසි අත්දැකීම් ඇති නිලධාරීන්ගෙන් සංයුක්ත කමිටුවක් මගින්, ශ්‍රී ලංකාව තුළ අධිකරණ බල සීමා නැවත නිර්ණය කිරීම ක්‍රමවත්ව සිදු කළ යුතු 'යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කරයි'

(යෝ/VI (1) 14/07)

## X . සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභා

2014.10.23 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.